# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1870/71 - 2014 ජූලි මස 11 වැනි සිකුරාදා - 2014.07.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 3/2012.

**1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත**

1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 12(1)(V) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 29 වන වගන්තිය යටතේ කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2014 ජූලි මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2014 කාබනික නිෂ්පාදන අපනයන සංවර්ධන නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, එම නියෝග 2014 ජූලි මස 10 වැනි දින සිට බලාත්මක විය යුතු ය.

2. කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන වගාකිරීමේ, නිපදවීමේ, සකස් කිරීමේ, නිෂ්පාදනය කිරීමේ, මෙහෙයවීමේ, විකිණීමේ, අපනයන කිරීමේ සහ ආනයනය කිරීමේ කාර්ය සඳහා මණ්ඩලය, ශ්‍රී ලංකාවේ කාබනික පාලන අධිකාරිය ලෙස සලකනු ලැබිය යුතු ය.

**ශ්‍රී ලංකා කාබනික ප්‍රමිති**

3. මේ නියෝගවල කාර්ය සඳහා, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ශ්‍රී ලංකා කාබනික ප්‍රමිති සකස් කිරීම සඳහා මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

4. 3 වන නියෝගයේ සඳහන් ප්‍රමිති සකස් කිරීමේ දී, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පහත දැක්වෙන කරුණු පිළිබඳව සැළකිලිමත්වී ඇති බවට මණ්ඩලය විසින් සහතික විය යුතු ය :-

(අ) කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන වගා කිරීම, නිෂ්පාදනය කිරීම, නිපදවීම, සකස් කිරීම, ලේබල් කිරීම, ප්‍රවාහනය කිරීම සහ විකිණීමට අදාළ අවශ්‍යතා ; සහ


1A - PG 2103— 360 (2014/07)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) කාබනික කෘෂිකර්මය හා කෘෂිකාර්මික නිෂ්පාදන පිළිගනු ලබන කාබනික කෘෂිකාර්මික සංවිධාන පිළිබඳ ජාත්‍යන්තර බල මණ්ඩලය, කෝඩෙක්ස් ඇලි මැන්ටැරියස් සහ සමාන ජාත්‍යන්තර ආයතන විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ සහ උචිත අවස්ථාවලදී, කාබනික නිෂ්පාදන වගා කිරීම, නිෂ්පාදනය කිරීම, නිපදවීම, සකස් කිරීම, මෙහෙයවීම, විකිණීම, අපනයනය කිරීම හා ආනයනය කිරීමට අදාළව යුරෝපා සංගමයේ රටවල්, ඇතුළුව, ආනයන සහ අපනයන රටවල් විසින් සාදනු ලබන නියෝග.

5. මණ්ඩලය විසින් 3 වන නියෝගයේ සඳහන් ප්‍රමිති පිළිගත යුතු අතර, එසේ පිළිගනු ලැබූ ශ්‍රී ලංකා කාබනික ප්‍රමිති, එම ප්‍රමිති පිළිගැනීමෙන් පසු ඕනෑම අවස්ථාවකදී, 26 වන නියෝගය යටතේ පත්කරනු ලැබූ උපදේශක කමිටුවේ උපදෙස් සැළකිල්ලට ගෙන, මණ්ඩලයේ නිර්දේශ මත සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

6. මණ්ඩලය විසින් පිළිගනු ලැබූ ශ්‍රී ලංකා කාබනික ප්‍රමිති සහ මෙම නියෝගවල සඳහන් විධිවිධාන පිළිපැදීම සහ ඒවාට අනුකූලව ක්‍රියා කිරීම කාබනික කෘෂි නිෂ්පාදන වගා කරන, නිපදවන, සකස් කරන, නිෂ්පාදනය කරන, මෙහෙයවන, ආනයනය කරන සහ අපනයනය කරන සෑම තැනැත්තකුගේම වගකීම වන්නේ ය.

**කාබනික කෘෂි නිෂ්පාදන සහතිකකරණ ආයතන, පරීක්ෂණාගාර සහ ආනයනකරුවන් සහ අපනයනකරුවන් ලියාපදිංචි කිරීම**

7. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රතීතන ප්‍රදානය කර ඇත්තා වූ යම් සහතිකකරණ හෝ පරීක්ෂණ ආයතනයක් හෝ පරීක්ෂණාගාරයක් විසින් මෙම නියෝගවල කාර්ය සඳහා ලියාපදිංචි වීම සඳහා මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

8. 7 වන නියෝගයේ සඳහන් ආයතනයක හෝ පරීක්ෂණාගාරයක පරිපාලන නිලධරයා හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආකෘතියෙන් මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. සහතිකකරණ ආයතනය හෝ විද්‍යාගාරය සඳහා වූ ලියාපදිංචි ගාස්තුව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

9. ලියාපදිංචිය සඳහා යොමු කරන ලද අයදුම් පත්‍රයක් පිළිබඳ ක්‍රියාවලියේදී, මණ්ඩලය විසින්, 26 වන නියෝගය යටතේ පත්කරනු ලැබූ සහතිකකරණය පිළිබඳ උපදේශක කමිටුවෙන් උපදෙස් ලබාගත හැකිය.

10. ලියාපදිංචි කිරීමෙන් පසු, මණ්ඩලය විසින් අවස්ථාවෝචිත පරිදි එම සහතිකකරණ හෝ පරීක්ෂණ ආයතනය හෝ පරීක්ෂාණාගාරය වෙත (මෙහි මින් මතු "ලියාපදිංචි සහතිකකරණ හෝ පරීක්ෂණ ආයතනයක් " හෝ ලියාපදිංචි පරීක්ෂණාගාරයක් " යනුවෙන් සඳහන් කරනු ලබන) ලියාපදිංචි සහතිකකරණ හෝ පරීක්ෂණ ආයතනයක් හෝ ලියාපදිංචි පරීක්ෂණාගාරයක් වශයෙන් පිළිගනු ලබන්නා වූ ආයතනයක් ලෙස සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

11. සෑම කාබනික කෘෂි නිෂ්පාදන අපනයනකරුවකු හෝ ආනයන කරුවකු හට මණ්ඩලය විසින් අනුමත කරන ලද ආකෘතියෙන් කරනු ලබන ඉල්ලීමක් මගින්, මණ්ඩලයෙහි ලියාපදිංචි වන ලෙස නියම කරනු ලැබිය යුතු ය.

12. 11 වන නියෝගයේ සඳහන් අපනයනකරුවකු හෝ ආනයනකරුවකු විසින් එකී ලියාපදිංචි සඳහා සහ එක් අවුරුද්දක කාලයක් සඳහා වලංගුවන්නා වූ අවසර පත්‍රයක් සඳහා මණ්ඩලය විසින් නිශ්චය කරන පරිදි වූ ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.

13. 12 වන නියෝගය යටතේ යම් අපනයනකරුවකුට හෝ ආනයනකරුවකුට නිකුත් කරනු ලබන බලපත්‍රයක් මගින්, ඔහු :-

(අ) අපනයනකරුවකු වන අවස්ථාවකදී, මේ නියෝගවල වෙනත් විධිවිධානවලට යටත්ව, එම අපනයනකරු විසින් අපනයන කරනු ලබන කාබනික කෘෂි නිෂ්පාදන මත, මෙම නියෝගවල උපලේඛනයේ දක්වා ඇති ජාතික කාබනික ජාතික ලාංඡනය භාවිතා කිරීම සඳහා ; හෝ

(ආ) ආනයනකරුවකු වන අවස්ථාවකදී, ජාත්‍යන්තරව පිළිගත් සහතිකයක් සමඟ කාබනික යන මුද්‍රාව හෝ ලේබලය දරනු ලබන කෘෂි නිෂ්පාදන ආනයනය කිරීම සඳහා ;

එම තැනැත්තා වෙත හිමිකමක් තිබිය යුතු ය.

14. මෙම නියෝගවල සඳහන් විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා, මණ්ඩලයෙහි ලියාපදිංචි කර ඇති සියලු අපනයනකරුවන්ගේ හෝ ආනයනකරුවන්ගේ ලැයිස්තුවක් සහ 13 වන නියෝගය යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රවල ලැයිස්තුවක් මණ්ඩලය විසින් කලින් කල රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

15. 12 වන නියෝගය යතේ පළමුව ලියාපදිංචි වීමෙන් අනතුරුව අවසර පත්‍රයක් ලබාගැනීමෙන් තොරව, කිසිම අපනයනකරුවකු විසින් කාබනික කෘෂි නිෂ්පාදනයක් වශයෙන් කිසිම කෘෂි නිෂ්පාදනයක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ එකී නිෂ්පාදනය මත ජාතික කාබනික ලාංඡනය භාවිතා කිරීම හෝ කිසිම ආනයනකරුවකු විසින් "කාබනික" යන මුද්‍රාව හෝ ලේබලය සහිත කිසිදු කෘෂි නිෂ්පාදනයක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම නොකළ යුතු ය.

16. 12 වන නියෝගය යටතේ පළමුව ලියාපදිංචි වීමෙන් තොරව ෲ

(අ) අපනයනකරුවකු යම් කාබනික කෘෂි නිෂ්පාදනයක් අපනයනය කරන හෝ අපනයනය කිරීමට උත්සාහ කරන අවස්ථාවක දී ;

(ආ) යම් ආනයනකරුවකු විසින් "කාබනික" මුද්‍රාව හෝ ලේබලය සහිත යම් කෘෂි නිෂ්පාදනයක් ආනයනය කරන හෝ ආනයනය කිරීමට උත්සාහ කරන අවස්ථාවක දී ;

අවස්ථාවෝචිත පරිදි, එම අපනයනකරු හෝ ආනයනකරු මෙම නියෝග යටතේ වරදකට වරදකරු වියයුතු අතර, වරදකරු කරනු ලැබීමේදී රුපියල් දසදහසකට අඩු නොවන සහ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩමුදලකට යටත්විය යුතු ය. එසේම, එම වරද සඳහා පනවන ලද දණ්ඩනයට අතිරේකව, වරද සිදුකර ඇත්තේ යම් භාණ්ඩ සම්බන්ධයෙන් ද එම භාණ්ඩ රාජසන්තක කිරීම සඳහා සහ අවස්ථාවෝචිත පරිදි එම භාණ්ඩ බැහැර කිරීම හෝ විනාශ කිරීම සඳහා උචිත නියෝගයක් නිකුත් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටීම සඳහා මණ්ඩලයට හිමිකමක් තිබිය යුතු ය. එම නිෂ්පාදන බැහැර කිරීමේදී හෝ විනාශ කිරීමේදී දරනු ලබන පිරිවැය අධිකරණයට උචිත බවට පෙනීයන ආකාරයට, එම වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් දරනු ලැබිය යුතු බවට අධිකරණය විසින් නියෝග කරනු ලැබිය හැකිය.

**කාබනික කෘෂි නිෂ්පාදන සහතික කිරීම**

17. කාබනික කෘෂි නිෂ්පාදනයක් වශයෙන් එම නිෂ්පාදනය අපනයනය කිරීම සඳහා සහ දේශීය වෙළඳපලෙහි විකිණීම සඳහා හැකිවන පරිදි, සෑම කාබනික කෘෂි නිෂ්පාදනයකම වගා කරන්නකු, නිෂ්පාදකයකු, සැකසුම්කරුවකු, නිපදවන්නකු, මෙහෙයවන්නකු, ආනයනකරුවකු සහ අපනයනකරුවකුම හට යම් ලියාපදිංචි සහතිකරණ ආයතයකින් හෝ ලියාපදිංචි පරීක්ෂණාගාරයකින් අනුකූලතා සහතිකයක් ලබා ගන්නා ලෙස නියම කරනු ලැබිය යුතු ය.

18. 17 වන නියෝගයේ සඳහන් අනුකූලතා සහතිකයක්, ඒ සඳහා අදාළ ලියාපදිංචි සහතික කරණ ආයතනය හෝ පරීක්ෂණාගාරය විසින් පිළිගත් කාර්ය පටිපාටියට අනුකූලව, තත්කාර්ය සඳහා එම ලියාපදිංචි සහතිකකරණ හෝ පරීක්ෂණ ආයතනය හෝ ලියාපදිංචි පරීක්ෂණාගාරය වෙත ඉල්ලීමක් කරනු ලැබීමෙන් පසුව ලබාගත යුතු ය.

19. ලියාපදිංචි සහතිකකරණ ආයතනයක් විසින් අදාළ කාබනික කෘෂි නිෂ්පාදනය, මණ්ඩලය විසින් පිළිගනු ලැබූ ශ්‍රී ලංකා කාබනික ප්‍රමිතිවලට අනුකූල වන්නේ ද යන්න පිළිබඳව තීරණය කිරීම සඳහා මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ප්‍රකාරව ක්ෂේත්‍ර පරීක්ෂණ ඇතුළුව, අවශ්‍ය වියහැකි සියලු පරීක්ෂා කිරීම් සහ විභාග කිරීම් සිදු කරනු ලැබිය යුතු ය.

20. අවශ්‍ය පරීක්ෂණ, විභාග සහ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි ලියාපදිංචි සහතිකකරණ ආයතනය හෝ පරීක්ෂණාගාරය විසින් එම අදාළ කාබනික නිෂ්පාදනය ශ්‍රී ලංකා කාබනික ප්‍රමිතිවලට අනුකූල බවට සෑහීමකට පත්වන්නේ නම්, එම ලියාපදිංචි සහතිකකරණ ආයතනය හෝ පරීක්ෂණාගාරය විසින් එම කාබනික නිෂ්පාදනය සම්බන්ධයෙන් අනුකූලතා සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය. අනුකූලතා සහතිකයක් නිකුත් කර ඇත්තේ යම් කාබනික නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ද එම කාබනික නිෂ්පාදනය මත "කාබනික" යන මුද්‍රාව හෝ ලේබලය භාවිතා කිරීම සඳහා හෝ ජාතික කාබනික ලාංඡනය භාවිතා කිරීම සඳහා එම කාබනික නිෂ්පාදනය හිමිකම් ලබන්නේ ය.

21. එකී කාබනික කෘෂි නිෂ්පාදනය සම්බන්ධයෙන් ලියාපදිංචි සහතිකකරණ ආයතනයක් හෝ ලියාපදිංචි පරීක්ෂණාගාරයක් විසින් අනුකූලතා සහතිකයක් නිකුත් කර ඇත්නම් මිස, තමා විසින් අපනයනය කරනු ලබන කිසිදු කාබනික කෘෂි නිෂ්පාදනයක් මත ජාතික කාබනික ලාංඡනය භාවිතා නොකරන බවට සහතිකවීම කාබනික කෘෂි නිෂ්පාදනවල සෑම ලියාපදිංචි අපනයනකරුවකුගේම වගකීම විය යුතු ය.

22. පළමුව එකී නිෂ්පාදනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන අනුකූලතා සහතිකයක් ලබාගැනීමෙන් තොරව, ජාතික කාබනික ලාංඡනය භාවිතා කරමින් යම් කාබනික කෘෂි නිෂ්පාදනයක් අපනයනය කරනු ලබන හෝ අපනයනය කිරීමට උත්සාහ කරනු ලබන සෑම ලියාපදිංචි අපනයනකරුවෙකුම මේ නියෝග යටතේ වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩ මුදලකට යටත්විය යුතු ය. එසේම 12 වන නියෝගය යටතේ ලබා දී ඇති ලියාපදිංචිය, එම දඩ මුදල පනවනු ලබන අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා අත්හිටවනු ලැබිය යුතු ය.

23. අනුකූලතා සහතිකයක් නිකුත් කර නොමැති යම් කාබනික කෘෂි නිෂ්පාදනයක්, එම නිෂ්පාදනය කාබනික කෘෂි නිෂ්පාදනයක් ලෙස විස්තර කරමින් යම් ලියාපදිංචි අපනයනකරුවකු විසින් අපනයනය කරනු ලබන හෝ අපනයනය කිරීමට උත්සහා කරනු ලබන අවස්ථාවක දී, එවැනි අපනයනකරුවකු මෙම නියෝග යටතේ වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කරනු ලැබීමේදී රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩ මුදලට යටත් විය යුතු ය. ඊට අතිරේක, 12 වන නියෝගය යටතේ එම අපනයනකරු වෙත නිකුත් කරන ඇති ලියාපදිංචිය එම දඩ මුදල පනවනු ලබන අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා අත්හිටුවනු ලැබිය යුතු ය.

24. 6 වන නියෝගයේ හෝ 15 වන නියෝගයේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරමින් යම් කාබනික කෘෂි නිෂ්පාදනයක් යම් ආනයනකරුවකු, අපනයනකරුවකු, වගා කරන්නකු, නිෂ්පාදකයකු, සැකසුම්කරුවකු, නිපදවන්නකු හෝ මෙහෙයවන්නකු විසින් විකුණනු ලබන බවට හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන බවට අනාවරණය වූ අවස්ථාවකදී එම ආනයනයකරු, අපනයනකරු, වගාකරන්නා, නිෂ්පාදකයා, සැකසුම්කරු, නිපදවන්නා හෝ මෙහෙවන්නා මේ නියෝග යටතේ වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන්දහසකට අඩු නොවන සහ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩ මුදලකට යටත් විය යුතු ය. එකී වරද සඳහා පනවනු ලැබූ දණ්ඩනයට අතිරේකව, එකී වරද සිදු කරනු ලැබුවේ යම් කාබනික කෘෂි නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ද, එම කාබනික කෘෂි නිෂ්පාදනය රාජසන්තක කිරීම සඳහා සහ අවස්ථාවෝචිත පරිදි බැහැර කිරීම හෝ විනාශ කිරීම සඳහා උචිත නියෝගයක් නිකුත් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටීම සඳහා මණ්ඩලයට හිමිකමක් ඇත්තේ ය. එම නිෂ්පාදන බැහැර කිරීමේ දී හෝ විනාශ කිරීමේ දී දරනු ලැබූ පිරිවැය අධිකරණය විසින් උචිත යැයි සලකන ආකාරයට එම වරදකරු කරනු ලැබූ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු බවට අධිකරණය විසින් නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකිය.

25. මේ නියෝග යටතේ වූ යම් වරදක් සඳහා නඩු පැවරීමේ දී, 8 වන නියෝගය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සහතිකකරණ ආයතනයක් හෝ පරීක්ෂණාගාරයක් විසින් අදාළ කෘෂි නිෂ්පාදනය සඳහා අනුකූලතා සහතිකයක් නිකුත් කර නොමැති බවට මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් සාක්ෂි ලෙස අවේශ්‍යකරගනු ලැබිය යුතු අතර, එහි සඳහන් කරුණු පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

26. මේ නියෝග යටතේ ස්වකීය කර්තව්‍ය කරගෙන යෑමේදී සහායවීම සඳහා මණ්ඩලය විසින් ප්‍රවීනයන්ගේ මණ්ඩල හෝ උපදේශක කමිටු පත්කරනු ලැබිය හැකි ය.

27. මේ නියෝග යටතේ ස්වකීය කටයුතු පවත්වාගෙන යෑමේදී සපයනු ලබන සේවා සම්බන්ධයෙන් නියමිත ගාස්තු අයකිරීම සඳහා මණ්ඩලයට හිමිකම් ඇත්තේ ය.

28. (1) (අ) යම් කෘෂි නිෂ්පාදනයක කාබනික තත්වයට බලපෑමක් සිදුවන පරිදි යම් අපනයනකරුවකු, ආනයනකරුවකු, නිෂ්පාදකයකු, නිපදවන්නකු හෝ මෙහෙයවන්නකු විසින් කරනු ලබන යම් අක්‍රමිකතාවක් හෝ උල්ලංඝනය කිරීමක් ;

(ආ) සාවද්‍ය අනුකූලතා සහතිකයක් භාවිත කිරීම ඇතුළුව මණ්ඩලය විසින් පිළිගනු ලබන ශ්‍රී ලංකා කාබනික ප්‍රමිතීන්ට යම් නිශ්චිත කෘෂි නිෂ්පාදනයක් අනුකූල වන බවට කරනු ලබන සාවද්‍ය නිරූපණයක් ;

(ඇ) යම් කෘෂි නිෂ්පාදනයක් මත සාවද්‍ය ජාතික කාබනික ලාංඡනයක් භාවිතා කිරීමක් ; හෝ

(ඈ) යම් ලියාපදිංචි සහතිකකරණ ආයතනයක් හෝ ලියාපදිංචි පරීක්ෂණාගාරයක් විසින් සිදුකරන විෂමාචාර ක්‍රියාවක් හෝ නොසැලකිල්ලක් ;

සම්බන්ධයෙන් අතෘප්තියට පවත්වන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(2) මණ්ඩලය විසින්, තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ පැමිණිල්ල පිළිබඳව විභාග කිරීමෙන් පසුව හා සිදුකර ඇති චෝදනාවේ ස්වභාවය පිළිබඳ සැලකිල්ලට ගෙන, එම පැමිණිලි කරනු ලැබූ චෝදනාවට අදාළ ක්‍රියාව සිදු කර ඇති බවට හඳුනාගනු ලබන තැනැත්තා සම්බන්ධයෙන් පහත දැක්වෙන පියවර එකක් හෝ වැඩි ප්‍රමාණයක් ගනු ලැබිය යුතු ය :-

(අ) ලියාපදිංචි තැපෑලෙන් අවවාදාත්මක දැනුම්දීමක් යැවීම ;

(ආ) අවස්ථාවෝචිත පරිදි එම තැනැත්තා වෙත නිකුත් කරන ඇති අවසරපත්‍රය හෝ ලියාපදිංචි සහතිකය අත්හිටුවීම හෝ අවලංගු කිරීම ;

(ඇ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා කාබනික කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම හෝ විකිණීම එකී තැනැත්තා හට තහනම් කිරීම ;

(ඇ) අදාළ තැනැත්තාගේ චෝදිත ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුට දරන්නට සිදුවූ හානිය හෝ වියදම් ආවරණය කර ගැනීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමාණවත් බවට තීරණය කරනු ලබන දණ්ඩනයක් පැනවීම ; හෝ

(ඉ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා එකී තැනැත්තා අසාධුලේඛනගත කිරීම ;

(3) මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ පැමිණිල්ලක් විභාග කිරීමේදී, 26 වන නියෝගය යතේ තත්කාර්ය සඳහා පත්කරනු ලැබිය හැකි මණ්ඩලයක හෝ කමිටුවක සහාය මණ්ඩලය විසින් අපේක්ෂා කරනු ලැබිය හැකිය.

29. මේ නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස :-

"මණ්ඩලය" යන්නෙන් 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සඳහන් වේ.

"මෙහෙයවන්නා" යන්නෙන් පසුව අලෙවි කිරීමේ අපේක්ෂාවෙන්, කාබනික යනුවෙන් හඳුන්වන නිෂ්පාදන, ස්වභාවිකව වර්ධනය වූ, ස්වාභාවිකව හටගත් හා ස්වාභාවිකව නිෂ්පාදනය කරන ලද හෝ ශ්‍රී ලංකා කාබනික ප්‍රමිති ප්‍රකාරව කාබනික ලෙස සහතික කළ නිෂ්පාදන නිපදවන, පාලනය කරන සකස් කරන, ප්‍රවාහනය කරන හෝ ලේබල් කරන තැනැත්තකු හෝ තැනැත්තන්, සංස්ථාපිත ආයතන හෝ සංවිධාන අදහස් වේ.

ලේබල් කිරීම සම්බන්ධයෙන් "කාබනික" යන්නෙන් මණ්ඩලය විසින් පිළිගනු ලැබූ ශ්‍රී ලංකා කාබනික ප්‍රමිති ප්‍රකාරව නිෂ්පාදනය කරන ලද, කාබනික කෘෂි නිෂ්පාදනයක් වශයෙන් ලේබල් කර ඇති යම් නිෂ්පාදනයක් අදහස් වේ.

"කාබනික කෘෂි නිෂ්පාදනය" යන්නෙන් පැලෑටි හෝ පැලෑටි නිෂ්පාදන වලින් හටගත් නිෂ්පාදනයක් අදහස්වන අතර එයට පශු සම්පත් හෝ පශු සම්පත් නිෂ්පාදන, මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදන සහ ජලජ නිෂ්පාදන ද ඇතුළත් වේ.

"ලියාපදිංචි සහතිකකරණ ආයතනය" යන්නෙන් අනුකුලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රතීතනය ලබාදෙන ලද 8 වන නියෝගය යටතේ මණ්ඩලයෙහි ලියාපදිංචි වූ කාබනික කෘෂි නිෂ්පාදන සහතිකකරණ හෝ පරීක්ෂණ ආයතනයක් හෝ පරීක්ෂණාගාරයක් අදහස් වේ.

"අනුකුලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය" යන්නෙන් 2005 අංක 32 දරන අනුකුලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පනත මගින් පිහිටුවනු ලැබූ අනුකුලතා තක්සේරු කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය අදහස් වේ ; සහ

"ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය" යන්නෙන් 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අදහස් වේ.

**උපලේඛනය**

ජාතික කාබනික ලාංඡනය

(13 වන නියෝගය)

| | | |
|---|---|---|
| **Green** | **:** | **#008601** |
| **Ocean Blue** | **:** | **#1c9cc9** |
| **Yellowish Brown** | **:** | **#c29134** |

07-812

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.